# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2259/9 - 2021 දෙසැම්බර් මස 21 වැනි අඟහරුවාදා - 2021.12.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

5 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වැඩබලන මුදල් අමාත්‍ය ජී. එල්. පීරිස් වන මම, සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනුමැතිය/නිර්දේශය ලබාගෙන ඇති සත්ත්ව ආහාර නිෂ්පාදකයින් සඳහා ''සත්ත්ව ආහාර'' නිෂ්පාදනයට අවශ්‍ය කෙරෙන බඩඉරිඟු (රේගු සංකේතාංක 1005.90) උපරිම වශයෙන් මෙ. ටොන් 40,000 ක් වූ ප්‍රමාණයක් ආනයනය කිරීම සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ වූ අංක 2228/3 සහ 2021 මැයි මස 17 දිනැති ගැසට් නිවේදනය මගින් අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු. 25 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 10 ක් අයකරගෙන ඉතිරි වටිනාකම අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

මෙම නියමය, 2021 දෙසැම්බර් මස 22 දින සිට මාස 06ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව වලංගුව පැවතිය යුතු ය.

මහාචාර්ය **ජී. එල්. පීරිස්,**
*වැඩබලන මුදල් අමාත්‍ය.*

2021 දෙසැම්බර් මස 21 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

EOG 12 - 0222

1A - PG 5666 — 485 (2021/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*